Mathematics.lk
FOR FUTURE EDUCATION IN SRI LANKA

Sri Lanka First and Only Mathematics Educational Website

Visit Our Website for More;

© LAHIRU KADURUGAMUWA EDUCATIONAL FOUNDATION

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2018<br>**උපකාරක ප්‍රශ්න පත්‍රය** | | | |
| ශ්‍රේණිය: 11 | විෂය: **බුද්ධ ධර්මය** | පත්‍රය: **II** | කාලය: පැය 2යි |
| නම:...................................................... | | | |

**සැළකිය යුතුයි.**

**පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. 2 සිට 7 දක්වා ප්‍රශ්න වලින් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන සම්පූර්ණ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

1) කෙටිපිළිතුරු සපයන්න.

   i. පංච මහාවිලෝකන වලින් මුල් කරුණු දෙක ලියන්න.

   ii. ධර්ම රත්නයේ සවැදෑරුම් ගුණ වලින් මුල් ගුණ දෙක ලියන්න.

   iii. 'භව තණ්හා' යන්නෙහි අර්ථය ලියන්න.

   iv. කර්මයේ ප්‍රධාන ප්‍රභේද දෙක ලියන්න.

   v. ත්‍රිවිධ කුසල චේතනා වලින් දෙකක් ලියන්න.

   vi. අනගාරික ධර්මපාල තුමා පැවිදිවූ පසු ලැබූ නාමය කුමක්ද?

   vii. සහජීවනය යනු කුමක් ද?

   viii. 'විසේසේන පස්සතීති විපස්සනා' යන්නෙහි අදහස ලියන්න.

   ix. දුමින්දාගමනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

   x. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියන්න.

(ලකුණු10x2=20)

2) i. සීලයේ ප්‍රධාන ප්‍රභේද දෙක ලියන්න. (ල. 02)

   ii. බුදු දහමේ "සීලය" ඇතුළත් ඉගැන්වීම් තුනක් ලියාදක්වන්න. (ල. 03)

   iii. "සිල්වත්වීම ඕනෑම සමාජයක දියුණුවේ පදනමයි."පැහැදිලි කරන්න. (ල. 05)

3) i. 'අත්තනාව කතං පාපං.........' යනාදී ධම්මපද ගාථාව ලියාදක්වන්න. (ල. 02)

   ii. එම ගාථාවේ සරල තේරුම ලියන්න. (ල. 03)

   iii. "ඕනෑම ශිෂ්‍යයෙකුට අකුසලින් වැළකී දියුණු අයෙකු වීමේ වගකීම ඇත්තේ තමාට ම ය. අන්අයට කළ හැක්කේ මග පෙන්වීම පමණි." පැහැදිලි කරන්න. (ල. 05)

mathematics.lk

4) i. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට ප්‍රධාන වූ හේතුව කුමක් ද? (ල. 02)

ii. එම සංගායනාවට අදාළ දායකත්වය, ප්‍රධානත්වය හා සහභාගී වූ රහතන්වහන්සේලා සංඛ්‍යාව ලියාදක්වන්න. (ල. 03)

iii. ධර්ම සංගායනාවලින් සමාජයේ දියුණුවට ලබා ගත හැකි ආදර්ශ සාකච්ඡා කරන්න. (ල. 05)

5) i. බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනාකොට වදාළේ කාහට ද? (ල. 02)

ii. එමසූත්‍රය අනුව සිසුන් ගුරුවරුන්ට ඉටුකරනු ලැබියයුතු යුතුකම් 3ක් ලියන්න. (ල. 03)

iii. "සමාජය ඉදිරියට ගමන්කරන්නේ එකිනෙකාට යුතුකම් ඉටුකර ගැනීම නිසාය."මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ල. 05)

6) i. දැහැමි රාජ්‍ය පාලකයෙකු වීමට සතර අගතියෙන් තොරවීම ඉතා වැදගත් වේ. මෙහි'අගතිය' යන්නෙහි තේරුම කුමක්ද? (ල. 02)

ii. එම සතර අගතියෙන් කරුණු තුනක් නමකරන්න. (ල. 03)

iii. දැහැමි පාලකයෙකු බවට පත්වීම සඳහා එම කරුණු වල වැදගත්කම සාකච්ඡා කරන්න. (ල. 05)

7) පහත මාතෘකා වලින් දෙකක් පමණක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. බුද්ධ කාරක ධර්ම

ii. රේණුකානේ චන්ද්‍රවිමල මාහිමිපාණන් වහන්සේ

iii. මහින්දාගමනය

iv. බුදු පිළිම වහන්සේලාගේ ආසන සහ මුද්‍රා (ලකුණු5x2=10)

mathematics.lk